# කොළඹ ආදුරුප්පු විදියේ වුල්ෆෙන්දාල් දේවස්ථානය

ඩබ්. ඒ. ටී. එස්. දර්ශන[1]

වර්ෂ 1749 දී ලන්දේසින් නිර්මාණය කළ කොළඹ ආදුරුප්පු විදියේ වුල්ෆෙන්දාල් රෙප්‍රමාදු දේවස්ථානය වටිනා ගෘහ නිර්මාණ ලක්ෂණ ප්‍රකට කරන්නකි. ග්‍රීක කුරුසයක හැඩයට නිර්මාණය කොට ඇති මෙහි බිත්ති අඩි 100ක් පමණ උසකින් යුක්ත වන අතර ඒ සඳහා කබොක් ගල් සහ පුලුස්සන ලද රතු ගඩොළු භාවිත කර ඇත. ආරුක්කු හැඩයට නිර්මාණය කොට ඇති ප්‍රධාන දොරටුව සහ දේවස්ථානය සිව් දිසාවේ දැවැන්ත ලෙස නිර්මාණය කරන ලද ඍජු කෝණාකාර බිත්තියේ ත්‍රිකෝණාකාර මුදුන් බිත්තිය සහිත සම්භාව්‍ය පුනරුද ශෛලියේ කුරෙන්තිය විශේෂ වේ. ආරුක්කු සහිත විශාල බිත්තිවලින් දරා සිටින වහලය අර්ධ ගෝලාකාර බොකු පියස්සකින් නිර්මාණය වී ඇත. ප්‍රධාන දොරටුවත් සමඟ ම ඉහළින් ඇති දැවමය සොල්දොරය ගීතිකා ගායනා කරන කණ්ඩායම වෙනුවෙන් ඉදි ව ඇති අතර ඒ බැල්කනියට පිවිසීමට දැවයෙන් ඉදි වූ තරප්පුවකි. දේවස්ථාන ගර්භයේ ඇති දැවමය ආසන පේළි සාමාන්‍ය ජනයාගේ සිට ආණ්ඩුකාරවරුන් දක්වා වෙන් කර ඇත. එසේ ම සියඹලා සහ කළු මැදිරිය ලීයෙන් තනා රතු විල්ලූ ඇතිරූ දේශන කුඩුවකි. පැති පහකින් යුතු මෙය අලංකාර වියනකින් ද සමන්විත ය. තව ද සුළං බලයෙන් ක්‍රියා කරන පයිප්ප ඕගනය, දේවස්ථානයේ පියතුමන්ගේ ප්‍රධාන ආසනය, සියඹලා කොටයකින් නිම වූ අලංකාර මොස්තරයන්ගෙන් පිරි බව්තිස්ම බඳුන, විවිධ දැව භාණ්ඩ, ප්‍රංශ ලාම්පු ආවරණ, රතු විල්ලූද ආවරණය කරන ලද වංශවතුන්ගේ ආසන ද දේවස්ථානය අභ්‍යන්තරයේ දැකගත හැකි ය. එසේ ම වර්ණිත වීදුරුවලින් අලංකාර කරන ලද ආරුක්කු හැඩයෙන් යුතු උස ජනේලවලින් දේවස්ථානය අභ්‍යන්තරයට ගලා එන ආලෝකයෙන් මවනුයේ ගුප්ත විචිත්‍රවත් ස්වරූපයකි. හතරැස් ගල් පතුරු සහ සොහොන් එලකවලින් බිම සරසා ඇති අතර ඒවා බොහොමයක් එකල සිටි ආණ්ඩුකාරවරුන්ගේ තොරතුරු සහිත එලක වේ. දේවස්ථාන භූමියේ පිටත මියගිය වංශවතුන්ගේ සොහොන් කොත් රාශියකි. මේ දේවස්ථානයෙහි උමං ද නිමවුණු අතර එකක් කොළඹ වරායට ද අනෙක ගාලු මුවදොරට ද විවෘත විය. මෙහි සීනු කුලුන කයිමන් දොරටුව අසළ පිහිටියේ ය. ලන්දේසි යුගයේ නිර්මාණය කරන ලද විශාලත්වයෙන් වැඩි ම රෙපරමාදු දේවස්ථානය වන මෙය ලන්දේසි ගෘහනිර්මාණ සම්ප්‍රදායය අවබෝධ කරගත හැකි වැදගත් ස්ථානයක් ලෙස අදටත් නිරුපද්‍රැත ව පවතී.

**ප්‍රමුඛ පදඃ** රෙප්‍රමාදු දේවස්ථාන**,** ගෘහ නිර්මාණය, ලන්දේසි යුගය,

---

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසගිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය